# ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 6
# දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1977 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1977 පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 6 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1977 පෙබරවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 47/76.

ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 6 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ [illegible]

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ 3 වන වගන්තියෙහි (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*61 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

'(6) ශ්‍රී ලංකාවේ වාසය නොකරන්නා වූ ද, වසතිය නොමැත්තා වූ ද යම් ඉල්ලුම්කරුවකු සඳහා හෝ එසේ වාසය නොකරන්නා වූ යම් ළමයකු සම්බන්ධයෙන් හෝ දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද අවසර දිය යුතුව තිබෙන දරුකමට හදා ගැනීමෙහි, සමාජයීය හා මානසික අංග පිළිබඳව සහ 4 වන වගන්තියේ සඳහන් කරුණු පිළිබඳව වාර්තාවක් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගෙන් කැඳවා, එය සලකා බැලීමෙන් පසුව දරුකමට හදා ගැනීමේ ආඥාවක් කිරීම යුක්ති සහගත බවට පත් කරන විශේෂ අවස්ථානුගත කරුණු ඇතැයි අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක ශ්‍රී ලංකාවේ වසතිය නොමැත්තා වූ ඉල්ලුම්කරුවකු සඳහා එවැනි දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය. තම වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේදී කොමසාරිස්වරයා විසින් එම වාර්තාව සමග, ඉල්ලුම්කරුගේ රට විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් දෙනු ලබන්නාවූත්, එම රටෙහි සිටින ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිත නියෝජිතයා විසින් සත්‍ය බවට සහතික කරනු ලබන්නාවූත් පරිසර අධ්‍යයන වාර්තාවක් ද ඇමිණිය යුතු ය.

මෙම උපවගන්තියේ "පරිසර අධ්‍යයන වාර්තාවක්" යන්නෙන් ඉල්ලුම්කරුගේ මානසික ස්වාස්ථ්‍යය, ඔහුගේ සමාජයීය, ආගමික හා ආර්ථික පසුබිම සහ දරුවකු දරුකමට හදා ගැනීමට ඔහුගේ සුදුසුකම් පිළිබඳ වාර්තාවක් අදහස් වේ.'.



2—ඒ 24387—10,319 (76/12)

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) දරුකමට හදාගැනීමේ ආඥාවක් කරන සෑම අධිකරණයක් විසින් එම දරුකමට හදාගැනීමේ ආඥාව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ දැනුම් දීම ලැබුණු විට, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, උප්පැන්න ලේඛනවල "දරුකමට හදා ගන්නා ලදී" යන වචන යෙදීමෙන් යම් සටහනක් සලකුණුකිරීම හා දරුකමට හදාගැනීමේ ලේඛනයෙහි උචිත සටහන කිරීම යන මේ කරුණු දෙකම සම්බන්ධයෙන් එම ආඥාවේ ඇතුළත් විධාන අනුව ක්‍රියා කිරීමට සැලැස්විය යුතු ය. තව ද, උප්පැන්න ලේඛනයෙහි එසේ එවැනි යම් සටහනක් කළ විට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ ඒ සටහන සැබෑ බවට සහතික කරනු ලැබිය යුතු ය.

(5) (අ) දරුකමට හදාගැනීමේ ආඥාවක විධාන අනුව දරුකමට හදාගැනීමේ ලේඛනයෙහි සටහනක් කරනු ලැබීමෙන් පසුව දරුකමට හදාගත් ළමයාගේ නම හෝ ඒ ළමයා දරුකමට හදාගැනීම කරන්නාගේ හෝ දරුකමට හදාගැනීම කරන්නන්ගේ නම හෝ නම් වෙනස් කරනු ලැබූ අවස්ථාවක, දරුකමට හදාගත් ළමයා වයස අවුරුදු විසි එකට වැඩි නම් ඔහු විසින්, නැතහොත් දරුකමට හදාගැනීම කරන්නා හෝ දරුකමට හදාගැනීම කරන්නන් විසින්, අවස්ථාවෝචිත පරිදි, දරුකමට හදාගත් ළමයාගේ නම පිළිබඳව නැතහොත් දරුකමට හදාගැනීම කරන්නාගේ හෝ දරුකමට හදාගැනීම කරන්නන්ගේ නම හෝ නම් පිළිබඳව ලේඛනයෙහි ඇති විස්තර වෙනස් කිරීමට විධාන කරන නියමයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නියමිත ආකෘතියෙහි ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ විභාගයක් පැවැත්වීමෙන් පසුව ඉල්ලීම අනුව දරුකමට හදාගැනීමේ ලේඛනයෙහි ඇති සටහනේ විස්තර වෙනස් කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් විධාන කළ හැකි අතර ඒ අනුව, ඔහු විසින්, ඒ වෙනස් කිරීම කළ යුතු ය; නැතහොත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(ඇ) දරුකමට හදාගැනීමේ ලේඛනයෙහි කරන ලද යම් සටහනක තිබෙන බව කවර විටක වුව ද දක්නා ලද යම් ලිපි දෝෂයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ නිවරද කරනු ලැබිය හැකි ය.

(ඈ) දරුකමට හදාගත් ළමයා වයස අවුරුදු විසි එකට වැඩි නම් ඔහු විසින්, හෝ ඒ ළමයා දරුකමට හදාගැනීම කරන්නා විසින් හෝ දරුකමට හදාගැනීම කරන්නන් විසින් හෝ නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කරනු ලබන ලිඛිත

ප්‍රකාශනයක් මත, ඒ දරුකමට හදාගත් ළමයා සම්බන්ධයෙන් දරුකමට හදාගැනීමේ ලේඛනයෙහි ඇති සටහනක සිද්ධි පිළිබඳව වූ හෝ සාරාර්ථය පිළිබඳ වූ විස්තර කිසිවක යම් දෝෂයක් ඇතැයි රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ ස්වකීය අත්සන සටහන් ලේඛනයෙහි අයින් තීරයෙහි යම් සටහනක් කිරීමෙන් දෝෂය නිවරද කිරීමට සලස්වනු ලැබිය හැකි ය.".

4\. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති එම ප්‍රඥප්තියෙහි 10අ සහ 10ආ වන වගන්ති වශයෙන් බලපවත් වන්නේ ය:— 10අ සහ 10ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"ත්‍රෛමාසික වාර්තාව. 10අ. (1) දරුකමට හදාගැනීමේ ආඥාවක් කිරීමට බලය පවරනු ලැබ ඇති සෑම අධිකරණයක් විසින් එක් එක් තුන් මස් කාලපරිච්ඡේදය තුළ එම අධිකරණය විසින් කරන ලද සියලු ම දරුකමට හදා ගැනීමේ ආඥා පිළිබඳ, (මෙහි මින් මතු "ත්‍රෛමාසික වාර්තාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) යම් වර්ෂයක ප්‍රථම ත්‍රෛමාසික වාර්තාව එම වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන කාල පරිච්ඡේදය සඳහා විය යුතු අතර ඒ වර්ෂය සඳහා වූ ඉතිරි ත්‍රෛමාසික වාර්තා එම වර්ෂයේ අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල පළමුවන දිනයෙන් ආරම්භ වන කාල පරිච්ඡේදය සඳහා විය යුත්තේ ය. ඒ කවර කාල පරිච්ඡේදයක් සඳහා වූ හෝ ත්‍රෛමාසික වාර්තාව එම කාලපරිච්ඡේදය ඉකුත් වීමෙන් පසු දින පහළොවකට වඩා පසු නොවී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(3) ඒ සෑම වාර්තාවක පහත සඳහන් විස්තර ඇතුළත් විය යුත්තේ ය:—

(අ) අධිකරණයේ නම;

(ආ) දරුකමට හදාගැනීමේ ආඥාවක් කරන ලද්දේ යම් යම් ඉල්ලීම් සම්බන්ධයෙන් ද ඒ එක් එක් ඉල්ලීමේ අංකය හා දිනය;

(ඇ) ඒ එක් එක් දරුකමට හදාගැනීමේ ආඥාවේ දරුකමට හදාගැනීම කරන්නාගේ නම හෝ හවුලේ දරුකමට හදාගැනීම කරන්නන්ගේ නම්;

(ඈ) ඒ එක් එක් දරුකමට හදාගැනීමේ ආඥාවේ ඇක්මෙන දරුකමට හදා ගත් දරුවගේ නම ; සහ

(ඉ) ඒ එක් එක් දරුකමට හදාගැනීමේ ආඥාව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබූ දිනය.

(4) ත්‍රෛමාසික වාර්තාවක් යවනු ලැබීමට ඇත්තේ යම් කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් ද ඒ කාලපරිච්ඡේදය තුළ එකී යම් අධිකරණයක් විසින් කිසිම දරුකමට හදාගැනීමේ ආඥාවක් කර නොමැති නම්, එම අධිකරණය විසින් ඒ කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසු දින පහළොවකට වඩා පසු නොවී එම කාලපරිච්ඡේදය සඳහා හිස් වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

දරුකමට හදගත් ළමයකුගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීම.

10ආ. (1) විවාහක අඹු සැමි දෙදෙනකුට හවුලේ ළමයකු දරුකමට හදාගැනීමට අවසර දෙමින් අධිකරණයක් විසින් දරුකමට හදාගැනීමේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක (එම දරුකමට හදාගැනීමේ ආඥාව මේ වගන්තිය ක්‍රියාත්මක වූ දිනට පෙර හෝ පසුව හෝ කරනු ලැබුවේ වුව ද) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඒ ළමයාගේ උප්පැන්නය කලින් ලියාපදිංචි කර ඇත්තේ වුව ද, එම විවාහක අඹු සැමියන්ගේ නම් ඒ ළමයාගේ ජනක මව් පියන් වශයෙන් ඇතුළත් කිරීමෙන් ඒ ළමයාගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කරවා ගැනීම සඳහා එම විවාහක අඹු සැමියන් විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නියමිත ආකෘතියෙහි ලිඛිත ප්‍රකාශනයක් කරනු ලැබිය යුතු ය. ඒ සෑම ප්‍රකාශනයකම රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශනයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු විට, ඒ ප්‍රකාශනය කරනු ලැබ ඇත්තේ යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා දරුකමට හදා ගැනීමට අධිකරණයක් විසින් ප්‍රකාශකයන්ට බලය දී ඇති බවට ඔහු සෑහීමට පත්වුවහොත්, නියමිත ආකාරයට ඒ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීමට සැලැස්වීම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(3) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වන, 27අ වන, 28 වන, 53 වන, 56 වන සහ 57 වන වගන්තිවල විධිවිධාන, උප්

පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද උප්පැන්නයකට අදාළ වන ආකාරයට (2) වන උපවගන්තිය යටතේ නැවත ලියාපදිංචි කරන ලද උප්පැන්නයකට අදාළ වන්නේ ය.

(4) දරුකමට හදාගනු ලැබූ ළමයකුගේ උප්පැන්නය මේ වගන්තියෙහි ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව නැවත ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක එම ළමයා සම්බන්ධයෙන් දරුකමට හදාගැනීමේ ලේඛනයේ ඇති උචිත සටහන "උප්පැන්නය නැවත ලියාපදිංචි කරන ලදී" යන වචනවලින් හා ඒ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීමට අදාළව නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තරවලින් සලකුණු කරනු ලැබීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"දරුකමට හදා ගැනීමේ ලේඛනය මහජනයා විසින් පරීක්ෂා කරනු හෝ සෝදිසි කරනු නොහැකි බව.

11. (1) 10 වන වගන්තිය යටතේ තබනු ලබන දරුකමට හදා ගැනීමේ ලේඛනය හා සූචිය මහජනයා විසින් පරීක්ෂා කරනු හෝ සෝදිසි කරනු ලැබිය නොහැක්කේ ය.

(2) මේ ආඥාපනත යටතේ උප්පැන්නය නැවත ලියාපදිංචි කර නොමැති දරුකමට හදා ගනු ලැබූ ළමයකු සම්බන්ධයෙන් වූ විට, 10 වන වගන්තිය යටතේ තබනු ලබන දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි සහ සූචියෙහි ඇතුළත් යම් තොරතුරක් හෝ එවැනි යම් ලේඛනයකින් හෝ සූචියකින් යම් පිටපතක් හෝ යම් උධෘතයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් යම් තැනැත්තකුට සැපයිය හැකි අතර, මේ ආඥාපනත යටතේ උප්පැන්නය නැවත ලියාපදිංචි කරනු ලැබ ඇති දරුකමට හදා ගනු ලැබූ යම් ළමයකු සම්බන්ධයෙන් වූ විට, අධිකරණයේ ආඥාවක් යටතේ හැර එවැනි කිසිම තොරතුරක්, පිටපතක් හෝ උධෘතයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නොසැපයිය යුතු ය.

(3) සටහන්වල සහතික පිටපත් හෝ සහතික උධෘත ඉල්ලා සිටීම හා නිකුත් කිරීම ද ඒ පිටපත් හෝ උධෘත වෙනුවෙන් සපයනු ලැබිය යුතු මුද්දර ද පිළිබඳව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 56 වන වගන්තියෙහි විධිවිධාන, (2) වන උපවගන්තිය යටතේ සහතික පිටපත් හෝ

සහතික උධෘත ඉල්ලාසිටීම, නිකුත් කිරීම සහ එම පිටපත්වලට මුද්දර ගැසීම සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ තබනු ලබූ දරුකමට හදා ගැනීමේ ලේඛනය සහ සූචිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තබා ගනු ලබන පොත් වූවාක් මෙන් අදාළ වන්නේ ය.".

16අ සහ 16ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති එම ප්‍රඥප්තියෙහි 16අ සහ 16ආ වන වගන්ති වශයෙන් බලපවත්වන්නේ ය :—

"දරුකමට හදා ගැනීමේ ලේඛනයෙහි හානිපත් හෝ නැති වූ සටහන් ප්‍රතියෝජනය කිරීම.

16අ. යම් දරුකමට හාදාගැනීමේ ලේඛනයක් හෝ එම ලේඛනයේ යම් සටහනක් හෝ නැති වුවහොත් හෝ එයට හානි සිදු වුවහොත් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, විභාගයකින් පසුව, තමා විධාන කරන ආකාරයකින් එහි පිටපතක් සාදන ලෙස, එහි හරි වැරදි බලන ලෙස හා එය සහතික කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය. එසේ කරනු ලැබූ විට ඒ පිටපත එසේ හානි සිදු වූ හෝ නැති වූ ලේඛනය හෝ සටහන වෙනුවට ආදේශ කරනු ලැබිය යුතු අතර, එසේ හානි සිදු වූ හෝ නැති වූ ලේඛනය හෝ සටහන ලෙස එය මේ ආඥාපනතේ සහ වෙනත් සෑම ලිඛිත නීතියකම සියලු කාර්යයන් සඳහා සලකනු ලබන්නේ ය.

නියෝග.

16ආ. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ කොටසෙහි ප්‍රකාශිත හෝ නියමිත යම් කරුණක් සඳහා හෝ සම්බන්ධයෙන් හෝ මේ කොටසෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලගැන්වීමේ කාර්යය සඳහා පොදුවේ හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ විට හෝ එම නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක සිට ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියෙහි "භාරකරු" පිළිබඳ අර්ථකථනයෙහි, එම අර්ථකථනය අගට ඇති නැවතීමේ ලකුණ වෙනුවට තිත් කොමාව ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තිය අගට පහත සඳහන් අලුත් අර්ථකථනය එකතු කිරීමෙන් :—

'"නියමිත" යන්නෙන් නියෝග මගින් නියම කරන ලද බව අදහස් වේ.'.